# බෞද්ධ ධර්ම ග්‍රන්ථයක් වශයෙන් සිංහල බෝධිවංශයේ අගය

ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ වැඩමවීම අරමුණු කොට සකස් කරන ලද්දකි, සිංහල බෝධිවංශය. එවන් ග්‍රන්ථයක් අනිවාර්යයෙන් ම ආගමික කරුණු ඉදිරිපත් කිරීම ස්වාභාවික ය. එවැනි ආගමික කරුණු එළි දක්වන ධර්ම ග්‍රන්ථයක් වශයෙන් සිංහල බෝධිවංශය කොතරම් දුරට වැදගත් වෙයි ද? විමසා බලමු.

ධර්ම ග්‍රන්ථයක අරමුණු අතර

- ශ්‍රාවකයන්ගේ සිතෙහි ශ්‍රද්ධාව වර්ධනය කිරීම,
- ධර්ම කරුණු ගෙනහැර දැක්වීම,
- ආගමික ඉතිහාසය විදහා දැක්වීම වැනි කරුණු දැකියහැකි වෙයි.

*“ඒ සර්වඥයන් වහන්සේ ද්වාත්‍රිංශත්වර මහා පුරුෂලක්ෂණයෙන් හා අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් හා ෂෙබ් සේක්ත නීල පීත ලෝහිතාවදාත මාංජිෂ්ඨ ප්‍රභාස්වරයෙන් විසිතුරු වූ ශෝභා ඇති ... සඳවලායෙන් හා දෙව්දුන්නෙන් හා විදුලියෙන් හා වට කරන ලද ස්වර්ණ පර්වතයක් මෙන් ද, තමන් වහන්සේගේ ශ්‍රී සමෘද්ධීන් සියලු ලෝකය ඒකාලෝක කරන සේක්...”*(දශබල පරිනිර්වාණ කථා) බුදුරජාණන් වහන්සේගේ ශරීරය එසේ මෙසේ එකක් නොවේ, එහි දෙතිස් මහා පුරුෂ ලක්ෂණ හා අසූවක් අනු ලකුණු ඇත. මේ ලක්ෂණ පිහිටන්නේ අතිශයින් ම උත්තමයන්ට ය. ඒ කියන්නේ බුදුරජාණන් වහන්සේ අතිශය උත්තමයෙකු බව නේ ද? බුදුරජාණන් වහන්සේ පිළිබඳ ව ශ්‍රාවකයාගේ සිත තුළ මහත් බැතිබර හැඟීමක් මේ නිසා ඇති නොවන්නේ ද? ඒ බුදුරජාණන් වහන්සේ නීල පීතාදි සවණක් රුස් පතුරුවන සේක. එය සන්ධ්‍යා වලා හා දෙව්දුනුවලින් අලංකාර වූ රන් පර්වතයක් මෙනි. රත්තරන් කන්දක් දෙව්දුනු හා සන්ධ්‍යා පලා වලින් අලංකාර වුණු විට කොතරම් අලංකාර වන්නේ ද? මේ වැනි රූපයක් සිතේ මවා ගන්නා සැදැහැති ශ්‍රාවකයා බුදුරජාණන් වහන්සේ පිළිබඳ ඇතිකර ගන්නා බැතිබර සිත කෙබඳු වේ ද? උන් වහන්සේ උපමා කරන්නේ රන් කන්දකට ය. කන්දක් යනු විශාල වස්තුවකි. බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රතාපවත් බව ශ්‍රාවක සිතට ඇතුළු කිරීමට කතුවරයා මේ යොදාගත් උපමාව අත්‍යයින් සාර්ථක ය. මේ මගින් ඔහු උත්සාහ කරන්නේ ශ්‍රාවක සිතේ සැදැහැ වැඩීමට නොවේ ද?

බුදුරදුන් සතු චතුර් වෛශාරද්‍යඥාන, දසබලධාරී බව, සම්‍යක් සම්බුද්ධ බව වැනි ගුණ රාශියක් දශබල පරිනිර්වාණ කථාවෙහි ම

දැක්වෙයි. විටෙක බුදුරදුන්ගේ රූප කායයෙහි සුවිශේෂත්වයත්, තවත්විටෙක උන්වහන්සේගේ ධර්මකායයෙහි සුවිශේෂත්වයත් ගෙනහැරපාමින් කතුවරයා බුදුරදුන් කෙරෙහි අප සිතේ භක්තිය දැනවීමට කටයුතු කරයි.

එසේ ම බුදුරජාණන් වහන්සේ දහම් දෙසීම සඳහා පුද්ගලයන් සොයා යොදුන් සිය ගණන් දුර ගමන් කළ සැටි මෙන් ම ඒසඳහා තමන් වහන්සේ සතු ඍද්ධිය භාවිත කළ සැටි ප්‍රකාශ කරන කතුවරයා එක් අතකින් බුද්ධානුභාවයත්, බුදුරදුන් සතු කරුණාවේ මහිමයත් කියාපාමින් අප සිතේ භක්තිය දියුණු තියුණු කරවයි. ඒ සැදැහැ වඩවන අයුරුයි.

ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් ගන්නට ධර්මාශෝක රජු ගිය අවස්ථාවේදී සිදු වූ පෙළහර ගැන සිතන්න. ශ්‍රී මහාබෝධීන් වහන්සේගේ කඳත් දකුණු ශාඛාවත් හැර අන් කොටස් නොපෙනී ගියේ ය. රජුගේ අධිෂ්ඨානයත් සමග දක්ෂිණ ශාඛාව ඉබේ ම සිඳී රන් කටාහයෙහි පිහිටියේ ය. බොහෝ පෙළහර සිදු විය.මිනිසුන් නොමිනිසුන් පමණක් නොව අජීවී දේ පවා ඒ අවස්ථාවේ නාද නංවමින් පූජා පැවැත්වී ය.

මෙවැනි දේ දිගින් දිගට ම විස්තර කරමින් බෝධිවංශ කතුවරයා උත්සාහ කරන්නේ බෝධීන් වහන්සේ කෙරෙහි අප සිත තුළ භක්තිය ඇති කරවීමට ය. බුදුරදුන් පරිභෝග කළ වස්තුවට මෙතරම් ආනුභාවයක් ඇත් නම් ඒ බුදුරදුන් සතුව කොතරම් ආනුභාවයක් ඇත් ද? අප සිතට නංවන සිතුවිල්ල එයයි.

පළමුවැනි ධර්ම සංගායනාව පිළිබඳ ව විස්තර කරන කතුවරයා විනය හා සූත්‍ර පිටක දෙකේ ම විවිධ කරුණු කෙටියෙන් වුවත් දක්වයි; දෙවැනි ධර්ම සංගායනාව ගැන කීමේදී දශ අකැප වස්තු පිළිබඳ ව විස්තර දක්වයි; සමහර විටෙක දහම් කරුණු ගෙනහැර දක්වමින් ඊට අදාළ පාළි පාඨ පවා දක්වයි; ඒ මගින් වැඩි යමක් ඉගෙනීමට අප සිත් පොළඹවයි.

මහා විහාර ප්‍රතිග්‍රහණ කථාවේ එන ශාසන අන්තර්ධානය පිළිබඳ විස්තරය මෙහි ලා අගය කළ හැකි තැන් අතර තවත් තැනකි. එහි ශීලය මෙන් ම ධර්මය පිළිබඳ කියන කරුණු කවරක් වුවත් ධර්මය පිළිබඳ ව අපේ සිත මෙහෙයවන සුලු ය. ශාසන පරිහාණිය පිළිබඳ ව කියන කරුණු බොහෝ ග්‍රන්ථවල දක්නට නැති දේ ය. ඒ මගින් ශාසනයේ අනාගතය ගැන සොයන්නෙකුට මෙන් ම සසුන පිරිහුණු කලක සසුනේ අතීත ස්වභාවය විමසන කෙනෙකුට ද බොහෝ දහම් කරුණු ඉගෙනගන්නට මග සලස්වයි. දහම් කරුණු විස්තර වන්නේ ධර්ම ග්‍රන්ථයකිනි. ඒ නිසා සිංහල බෝධිවංශය ද ධර්ම ග්‍රන්ථයකි.



edulanka.lk

www.eduLanka.LK